


ඔහුගේ ඇඳුම් පැරණියග ෆැක්ටරි වල වැඩ කරනා කවුරුත් පාහේ අඳිනා ඕවරෝලය බොහෝ වර සේදීම නිසා ම අව පාට වී ගොසිනිග ලංවී බලන්නෙකුට එහි තැනින් තැන නූල් දියවී ගිය අයුරු පවා පෙනේ. වැඩ අහවර වී ඇඳුම් අහවර නොකර ම සාප්පු සංකීර්ණයට ආවා විය යුතුය. මා ඔහු මුල්වරට දකිනා අවස්ථාවේ ඔහු මැක්ඩොනල්ඩ්ස් අවන්හලේ පෝලිමක හිස් ඇසින් කෑම පුවරුව දෙස බලා හිඳිනවා දුටිමි. අඩි හයක් පමණ උස මහත ඔහු දැවැන්තයග හිස කෙස් තට්ටයටම පාහේ කොට කර කපා තිබුණු නිසා දෝ ඔහු කම්කරුවකුගේ සාම්පලයක් වැනිය. අපිලිවෙලට වැඩුණු මුහුණ පුරා වූ රැවුල තැන් තැන සුදු ගස් මතුව එමින් තිබිණි. බොහෝ වැඩ කරන මිනිසුන් මෙන් සතියකට දවසක් රැවුල බෑමේ පුරුද්දට ඔහුත් ඇබ්බැහි වූවා වැනිය. හේ කුඩා දරුවකුගේ අතින් අල්ලාගෙන සිටියේ.

පොඩි එකා තාත්තා ගේ දනිසට වඩා යන්තමට උසය. කේඩෑරිය. තාත්තා ත් පුතා ත් යෝදයා හා කුරුමිට්ටා සිහියට නංවයි. අතේ එල්ලීගත් වන ම තොර තෝංචියක් නැතිව තාත්තා ගෙන් ප්‍රශ්න කරයි. තාත්තා තවමත් දවසේ වෙහෙස ගෙවා ගනු පිණිස වෙනත් ලොවක පාවෙනවා වැනිය. එක්කෝ දවස පුරා හිටගෙන හිඳ රිදෙනා පා පතුල ඔහුට වද දෙනවා ඇත. නැතිනම් තවමත් හිසේ දෝංකාර දෙන යන්තර වල හඬින් තෝන්තු වෙනවා ඇත. පොඩි එකාගේ කරදරයෙන් බේරිල්ලක් නැති තැන හේ දීර්ග හුස්මක් හෙලා පුතා වෙතට හැරිණි. පුතාට ඉහේ මලක් පිපුණා වැනිය. ඉන් පසු කෑම බහාලූ කවරයත් සෙල්ලම් බඩුවත් අතට ලැබෙනා තෙක්ම තාත්තාත් පුතාත් බර කථාවක වැටී සිටිනු මම දුටුවෙමි. පුතාගේ බොහෝමයක් ප්‍රශ්න යොමු වූයේ ඔහුගේ අතේ වූ තාමත් ඉටි කවරය කඩා නොතිබූ ළමා සඟරාව ගැන විය යුතුය. සෑම පුවත්පත් අලෙවිහලක ම විකුණන පොඩි වුන් සඳහා පළ වන මේ සඟරා පැකට්ටුවේ සෙල්ලම් බඩුවක් හෝ කාඩ් කිහිපයක් හෝ ස්ටිකර් තිබෙනා බව මම දනිමි.

දිගු මේසයේ මැද හරියේ වූ හිස් පුටුවක වාඩි වුණු තාත්තා සිඟිත්තාගේ කෑම කවරය තුළින් ගත් දේ පිළිවෙලට මේසය මත තබන්නට විය. සඟරාව පුතාගේ අතින් ගෙන මේසය මත පැත්තකින් තබා ඔහු පුතුගේ අවධානය කෑමට යොමු කරවීය. හෙමින් හෙමින් බදින අල තීරු තලු මරන සිඟිත්තාගේ වටකුරු හිනා පිරි දෑස දෙස බලා ඉන්නා ඔහුගේ දෑසෙන් වෙහෙස නිවී සොම්නස උපදිනවා මම දුටිමි.

දැරිය සිටියේ ඔවුන් වාඩිවී සිටි දිගු මේස පේලියේ අනෙක් පැත්තේ අසුන් තුන හතරකට එහාය. ඇගේ දෙකන් වලම ශ්‍රවනාධාර සවි කර තිබිණි. සිඟිති දෑස වසා වටකුරු බෝතල් අඩි කණ්නාඩි දෙකක් තිබිණි. සිහින් නිල් පැහැ රාමුවක සවි කෙරුණු ඝනැති උපැස් තුළින් ඇගේ දුඹුරු දෑස වඩාත් විශාල වී සිඟිති වුවාට විශාල වී පෙනෙනා දෑස් එක් කළේ වඩාත් අස්වාභාවික පෙනුමකි. ඈ මේසය මත හිස තබා ගෙන අතැඟිල්ලකින් කෙස් රොදක් කරකවමින් සිටියාය. ඉදිරියට නෙරූ සිඟිති නිකටත් බෝතල් අඩි කණ්නාඩි යුවලත් ශ්‍රවනාධාර රැඳි කුඩා කන් පෙතිත් ඇය යම් කිසි අසාමාන්‍යතාවයකින් යුතු ළදැරියක් බව මොනවට කියා පෑය. කායික හෝ මානසික ඌනතාවයකින් පෙළෙනා බැවු පෙනුනත් ඈ පිරිසිදු පාසැල් නිල ඇඳුමක් ඇඳ සිටියාය. නිල ඇඳුමත් ඊට උඩින් ඇඳි පාසැල් ලාංඡනය යුතු ජම්පරයත් පිට කබායත් නිසා අද වැනි සීත දවසක පාසැල් යා යුතු පරිද්දෙන් කවුරුන් හෝ ඈ මනාව සරසා තිබිණි. මා මුලින් සිතූයේ ඇගේ අම්මා කෑම පෝලිමේ රැඳී සිටිනා බවකි.

මේසය මත හිස තබාගෙන සිටි ඇයට යෝධ කම්කරුවා මේසය මත තැබූ සඟරාව ඇස ගැටිණි. හිස තබා ගත් වනම ඈ ඒ දෙස බොහෝ වේලා බලා සිටියා ය. ඉන්පසු හිමින් සීරුවේ අසුනින් නැගිට ගත් ඈ සෙමින් ඇවිත් කම්කරුවාත් ඔහුගේ පුතාත් ඉදිරියේ වූ හිස් අසුනේ ඈඳි ගති. ඈ ඇවිද එන විට ඇගේ පාවල බකල ගතියක් වූ බව මම දුටිමි. ඈ කය සිහින් ය. කුඩා ය. කයේ ප්‍රමාණය මේසය මත තබාගෙන සිටි ඇගේ මුහුණට කොහෙත්ම නොගැලපිණි. කිරි දත් හැලුණු ඇගේ මුහුණින් වයස අවුරුදු දහයක් වත් වෙතැයි සිතුණත් ඇගේ සිඟිති කය අවුරුදු හතරක් පහක් වයස

> <u>*දැරිය කුමක් දෝ කීවාය. මට එය නෑසිනි. මට ඇගේ මුහුණ බලන්නට බැරි විය. මා බැලූයේ කම්කරුවාත් ඔහුගේ පුතාත් දෙසය.*</u>

සිඟිත්තාගේ කෙසඟ සිරුරට වඩා විශාල වූයේ යාන්තමිනි.

ඈ කම්කරුවා දෙස බලා සිනාවක් පෑවාය. ඒ මිහිර සිනාවත් සමඟ ඇගේ කම්මුල දෙපස වල ගැසෙනු මා දුටිමි. පුංචි පුතාට ඇගේ පැමිණීම නොදැනුණා තරම් ය. කෑම වේලත් සමඟ ලැබුණු කුඩා නිල් පැහැති කාරය ඔහුගේ අවධානය සහමුලින්ම ඇදගත්තා වැනි ය. තවමත් ඉටි කවරයේ ඇතුළ ඇති කාරය එහා මෙහා හරවමින් බලනා ගමන් අල තීරුවක් දෙකක් කටේ ඔබා ගත්තා විනා ඔහු ඈ එනවා වත් නොදුටුවා වැනි ය. තාත්තා ඇය පුටුවෙන් නැගිටිනවා පවා දුටුවේය. සමහර විට ඇය සඟරාව දිහා බලා සිටි හැටි ද ඔහු දකින්නට ඇත.

ඈ ඇගේ කෙසඟ දුබල සිරුර පුටු අතරින් හසුරුවමින් තමා වෙතට එනු දුටු කම්කරු-වා ගේ ඇස් මෙලෙක් බැල්මකින් පිරී යනු ද නළලතේ සිහින් රැල්ලක් දෙකක් නැගෙනවා ද මම බලා සිටියෙමි. ඔහු වරක් හෝ දෙකක් මාරුවෙන් මාරුවට තම පුතු දෙසත් කුඩා දැරිය දෙසත් බැලීය. ඇගේ සිනාවට පිළිතුරු සිනාවක් පෑ ඔහු ඔහුගේ පුතා දෙස බලා සිටිනා බව ඇඟවූවත් සැබැවින් ම බලා සිටියේ ඔහු ඉදිරියේ වාඩි වී සිටිනා දැරිය දිහා ය.

මේසය දෙසට නැඹුරු වුණ දැරිය සඟරාවේ මුල් කවරය දෙස බලන්නට ගත්තා ය. ඇයට අකුරු කියවිය හැකිව තිබුණි.

'This is for boy' ඇය ඇයට ම මුමුණා ගනු මට ඇසිණි.

ලොකු කර ගත් කටින් ද අකුලුවා ගත් දෑසින් ද ඇය කවරයේ වූ අකුරු එකිනෙක අහුලා කියවන්නට ගත්තී ය. කම්කරුවා නිහඬව ඇය දෙස බලා සිටියේය. කියවා ගත නොහැකි බැල්මක් ඔහුගේ මුහුණේ රැඳී තිබිණි. හදිසියේ දැරිය හිස එසවීය. ඇගේ දෙනෙත් එක් වරටම ඔහුගේ දෑසේ




තුසිත් රවීන්ද්‍ර අබේනායක

පැටලිණි. ඒ දෑසේ වූ කරුණාව අඳුනා ගත් ඇගේ සබකෝල හැඟීම ගිලිහිනි.

'Can I touch this?' ඈ සිහින් හඬින් මුමුණනවා මට ඇසිනිග 'It's my son's. I have to ask him or he will cry' ඔහු ඇයට කීය. කම්කරුවා තම පුතු දෙසට හැරිණි. යෝද අත්ල තම පුතු හිස මත තැබූ හේ වෙනත් භාෂාවකින් මොනවාදෝ මිමිණීය. ඒ අතරතුරේ හෙතෙම වරින් වර සඟරාව පෙන්වනු ද මම දිටිමි. මේ වන විට කුඩා කාරයත් අල පෙතිත් අතැර දැමූ කුඩා ළමයා දෑතින්ම ගත් බර්ගරය සපමින් සිටියේය.
මුලදී නුරුස්සනා බැල්මෙන් කුඩා දැරිය දෙස බැලූවත් තාත්තාගේ කථාවෙන් පසුව ඔහු අනුමත කරන ලීලාවෙන් හිස වැනීය.

'Yes you can. He is OK with it.' ඔහු දැරියට කීය. දැරියගේ දෑසේ සිනාව ඉතිරිනි. ඈ සඟරාව ඩැහැ ගත්තා වැනි ය. ඉටි කවරයෙන් වැසුණු සෙල්ලම් බඩුත් මුල් කවරයේ හා අග කවරයේ චිත්‍රත් ඈ නිමක් නැතිව අතගාන්නට විය. පිට කවරයේ වූ කුමක් දෝ පින්තූරයක් කියවනා ගමන් ඈ කටහඬ අවදි කළා ය.

'What's his name. Does he know English?' ඈ ඇසීය. පුතා දෙස හැරුනු කම්කරුවා යළිත් විදේශීය භාෂාවකින් තම පුතාට යමක් කීය. තමාගේ කෑම වේලට බාදා කිරීමත් තමාගේ සඟරාව අතට ගැනීමත් ගැන යම් පමණකට හෝ හිත නරක් වී ඇති කුඩා දරුවා ඔහුගේ නමත් වයසත් චතුර ඉංග්‍රීසියෙන් ඇයට කියා දමා යළිත් කෑම පැකැට්ටුවට හිත යොමු කළේය.

ඔහුගේ අමනාපය ඈට දැනුණා වැනි ය. තිදෙනා අතර දැඩි නිහඬතාවක් ඇති වින. පුංචි එකා කෑම තලුමරනා හඬත් කුඩා දැරිය පොලිතින් කවරය ඒ මේ අත හරවන හඬත් හැර කිසිදු හඬක් නොනැගී විනාඩි කිහිපයක් ම ගෙවුණි. යළිත් එය කඩ කළේ දැරිය ම ය.

'Can I touch this please?' ඇගේ බැල්ම ඉල්ලීමකටත් වඩා ආයාචනයක් වැන්න. කම්කරුවා යළිත් තම පුතු විමසීය. මෙවර පිළිතුර ක්ෂණික ය. පැහැදිලි ය. කුඩා දරුවා තම පියාගේ දෑස දෙස බලා ගෙන ම ස්ථිර ලෙස හිස දෙපසට සැලීය. ඒ බැල්මේත් හිස වැනීමේත් තේරුම මටත් දැණින.

'Sorry he doesn't like to open. I'm sorry' හේ ඈ අමතා කීය. සිඟිති වුවන මැලවෙනවා මම දිටීමි. තිදෙනා අතරින් වඩාත් ම පීඩාවට පත් වූයේ කම්කරුවා වෙන්නට ඇතැයි මුහුණු තුනම පිරික්ෂා බැලූ මට සිතිනි.

පොඩි එකා උඩින් පල්ලෙන් කෑම කා අහවර කළේය. තව දුරටත් මෙතැන රැඳී සිටීම තමාගේ සඟරාවට එතරම් ගුණ යහපත් නැති බව ඔහුට තේරුණා වැනි ය. හේ තාත්තාට පිටත් වෙමු යැයි යළි යළිත් කියන්නට විය. කෑම මේසය මත වූ සියලු දේ බන්දේසියට දැමූ කම්කරු-වා තම පුතුගේ අතින් ගෙන නැගී සිටියේ ය. අසුනින් නැගිට ගත් කුඩා දැරිය මේසය හරහා නැමී තම අත තිබුණු සඟරාව සිඟිත්තා අත තැබීය. කෙටි සමුගැනීමකින් පසු යෝධ කම්කරුවා සිඟිති පුතුගේ අතින් ගෙන සෙනඟ අතරින් පඩි පෙළ කරා ගමන් කරන්නට විනි.

ඔවුන් දෙදෙනාගේ රුව පඩි පෙළ උඩට ඇදී නොපෙනී යනවා මම බලා සිටියෙමි. ඔවුන් නොපෙනී ගිය පසුව දැරිය දෙස හැරුණු මට දැරියත් ඔවුන් නොපෙනී ගිය දෙසම බලා සිටිනවා මම දුටිමි. සන්සුන් වූ ඇය පුරුදු පරිදි ඇගේ හිස මේසය මත තබා ගත්තාය. අතේ දබරැඟිල්ලටත් මැදැඟිල්ලටත් හසු කර ගත් කෙස් රොදක් කරකවන්නට පටන් ගත්තාය.

අවන් හලත් ඒ අවටත් ජනාකීර්ණය. මිනිසුන් ඒ මේ අත ඇවිද යයි. සමහරෙකු මිලට ගත් අහර අනුභව කරති. තවත් අයෙක් මිලට ගත් දේ යළිත් බෑග් වලින් එළියට ගෙන ඒවා පිරික්සා බලති. තරුණ වියේ වුන් කොලු රැනක් මහ හඬින් සිනා වෙමින් විහිලුවක් රස විඳිති. අසල වූ ඉලෙක්ට්‍රොනික් ක්‍රීඩාගාරයෙන් නිම් නැති වෙඩි හඬවල් ද අපූරු නාද රටා ද ඇසෙයි. මම නිහඬවම

30 පිටට